# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 9,562—1946ක්වූ මැයි මස 31 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

ආණ්ඩුවේ සාවශ්‍යත්තකට, එනම්:—පාරවල් පලල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට හිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

ප්ලෑනේ නො. A 1,988. ගම—කිරිල්ලපනේ හැගෙනහිර (කොටසක්).

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මිනුම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | කිඹිරිගහවත්ත, වරිපනම් නො. 23 කොටසක්, කිරිල්ලපනේ, නාරාහේන්පිට පාර | අවුරුදු 30 කොස්ගස් 3ක් ඇති ඉඩම | කේ. බී. ඒබ්‍රහම්, කේ. බී. චාර්ලිස්, කේ. බී. එමාගිස්, කිරිල්ලපනේ | 0 | 0 | 0·9 |
| 2 | කිඹිරිගහවත්ත, වරිපනම් නො. 25 කොටසක්, කිරිල්ලපනේ, නාරාහේන්පිට පාර | අවුරුදු 3 පොල්ගසක්ද, අවුරුදු 5 උගුරැස්සගසක්ද ඇති ඉඩම | විච්චමුල්ලගමගේ දොන ලාසිස් පෙරේරා සහ සුගිවාරංගිත්, කිරිල්ලපනේ සහ විච්චමුල්ලගමගේ දොන සැලි පෙරේරා, රත්මලාන | 0 | 0 | 1·8 |
| 3 | කිඹිරිගහවත්ත, වරිපනම් නො. 27 කොටසක්, කිරිල්ලපනේ නාරාහේන්පිට පාර | අවුරුදු 15 කොස්ගස් 3ක්ද, අවුරුදු 10 පොල්ගස් 3ක්ද, අවුරුදු 5 අඹ ගසක්ද ඇති ඉඩම | කේ. හෙන්රි පෙරේරා, කිරිල්ලපනේ | 0 | 0 | 2·2 |
| 4 | කිඹිරිගහවත්ත, වරිපනම් නො. 28 කොටසක්, කිරිල්ලපනේ, නාරාහේන්පිට පාර | පාර .. .. | සයිමන් සිල්වා, පිටකෝට්ටේ .. | 0 | 0 | 0·4 |
| 5 | දෙල්ගහවත්ත, වරිපනම් නො. 53 සහ 55 කොටස්, හරස්පාර | අවුරුදු 25 පොල්ගස් 3ක්ද, උළුසෙවිලි කපරාරුකල ගෙයක අගුවල කොටස්ද, වැලිපෝන් කණුවක්ද ඇති ඉඩම | ජී. ජෙරෝනිස් පෙරේරා, කිරිල්ලපනේ | 0 | 0 | 6·1 |
| 6 | දෙල්ගහවත්ත, වරිපනම් නො. 53 කොටසක්, හරස්පාර | කෙසෙල් පඳුරු 5ක් ඇති ඉඩම .. | ජී. ලූවිනා පෙරේරා, කිරිල්ලපනේ | 0 | 0 | 3·9 |

ප්ලෑනේ නො. A 1,989. ගම—කිරිල්ලපනේ හැගෙනහිර (කොටසක්).

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මිනුම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | දෙල්ගහවත්ත, වරිපනම් නො. 23 සහ 25 කොටස්, හරස්පාර | අවුරුදු 40 අඹගසක්ද, අවුරුදු 15–20 කොස්ගස් 3ක්ද, පුවක්ගස් 4ක්ද, අඹගසක්ද, අවුරුදු 3 කෝපිගසක් සහ ජම්බුගසක්ද, වැලිපෝන් කණුවක්ද, අතුසෙවිලි මැටිබිත්ති කුඩා ගෙයක කොටසක්ද ඇති ඉඩම | බී. එමලියා පෙරේරා, කිරිල්ලපනේ, බී. සොපියා පෙරේරා සහ බී. සිසිලියා පෙරේරා, හයිස්ට්‍රීට් වැල්ලවත්ත | 0 | 0 | 8·3 |
| 2 | පාලුවත්ත, වරිපනම් නො. 15 කොටසක්, ඇඩ්මොන්ටන් පාර | අවුරුදු 1 පොල්පැලයක්ද, අන්නාසි පඳුරක්ද ඇති ඉඩම | ඒ. සිත්තම්පලම්, කිරිල්ලපනේ .. | 0 | 0 | 1·5 |

ප්ලෑනේ නො. A 1,990. ගම—කිරිල්ලපනේ හැගෙනහිර (කොටසක්).

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මිනුම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | දෙල්ගහවත්ත (පුරාරාම), වරිපනම් නො. 7 කොටසක්, කිරිල්ලපනේ, නුගේගොඩ පාර | අවුරුදු 10 අරලියගසක්ද, ඉලැක්ට්‍රික් ස්ටෑන්ඩ් එකක් තබා තිබෙන කොන්ක්‍රීට් කණුවක්ද ඇති (බෞද්ධ පන්සල් ඉඩමක කොටසක්වූ) ඉඩම | පී. ධම්මාලෝක ස්ථවිර, නේවාසික | 0 | 0 | 1·4 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1946ක්වූ ජූනි මස 24වෙනි දින පෙරවරු 10ට මෙම කච්චේරියේදී මා ඉදිරියට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑම සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1946ක්වූ මැයි මස 27වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ඒ. ඇල්. බී. පර්ඩිනන්ඩ්,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත විසිනි.

---

ආණ්ඩුවේ සාවශ්‍යත්තකට, එනම්:—හැවමාන්නේ මාතෘ නිවාසයක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරන පිණිස "(203 වැනි පරිච්ඡේදය) ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරක සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට හිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

අතුරු සිතියම් නො. 6, සිතියමේ නො. 296. ගම—හැවමාන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මිනුම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 768 | පත්තිනිගෙවත්ත, කහබිලිලගාව හේන, කහබිලිලගාවවත්ත | අවුරුදු 7ක් වයසැති කොස්ගස් 4ක්ද, අවුරුදු 20ත් 25ත් අතර වයසැති පොල්ගස් 20ක්ද, කොස්ගස් 8ක්ද, අවුරුදු 10ක් වයසැති අඹ ගස් 6ක්ද, කජුගස් 6ක්ද, පුවක්ගස් 6ක්ද, කිතුල්ගස් 3ක්ද, ජුල්ගසක්ද, "සිට්‍රස්" ගස් 2ක්ද වේ | (1) ජෝන් විජේසිංහ, (2) හැන්ඩ්‍රික් විජේසිංහ, (3) ජයතිස්ස විජේසිංහ, (4) ෆ්‍රැන්සිස් විජේසිංහ, (5) පියතිස්ස විජේසිංහ, (6) ෆ්‍රැන්සිස් දෙඹම්පෙ රත්නායක, සියල්ලෝම හැවමාන ගෙහි වෙති | 2 | 0 | 32·2 |
| 769 | පුවක්ගහදෙනිය.. | පාවරකි, අවුරුදු 20ක් වයසැති පොල්ගස් 5ක් වේ | එම .. .. | 0 | 0 | 3·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහත ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1946ක්වූ ජූලි මස 4වෙනි දින පූ. භා. 9යේ කාලයට ගැටමාන්නෙ වෙළඳපොලෙහිදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1946ක්වූ මැයි මස 21 වැනි දින
හම්බන්තොට කච්චේරියේදීය.

සී. ජේ. ඕර්ලොෆ්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ,

---

ආණ්ඩුවේ කවශ්‍යත්තයට, එනම්:— පහල බෙලිගල්ලේ මහවැව ඉවුර හා කණ්ඩිය හැදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "(203 වැනි පරිච්ඡේදය) ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට, පලාත් ආණ්ඩු කාරක සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

අතුරු ගම් සිතියමේ නො. 4, සිතියමේ නො. 262. ගම—ඉහල බෙලිගල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමක්යන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 128 | වෙඅත්තෙකුඹුර .. | කුඹුර .. | (1) ගංගොඩගේ සුගතදාස, අගුරුවදුව, (2) දෙහෙ කොර්නේලිස් බබප්පු දේවසුරේන්ද්‍ර, (3) ජේම්ස්හාමි දේවසුරේන්ද්‍ර, (4) ජූම්ඩානිස්හාමි දේවසුරේන්ද්‍ර, (5) ලෝකුරුගේ දෙහෙ අබරන් සහ (6) ලෝකුරුගේ තෙපානිස් අබේසිරිනාරායන, සියල්ලෝම පහල බෙලිගල්ලේය | 3 0 28 |

අතුරු ගම් සිතියමේ නො. 2. සිතියමේ නො. 285. ගම—පහල බෙලිගල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමක්යන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 123 | ලෝකුරුගෙපංගුව .. | කුඹුර, වැව්කණ්ඩිය හා වැව්ඉවුර | (1) ලෝකුරුගෙ කරෝලිස්හාමි අබේවතීන, අගුරුවදුව, (2) ලෝකුරුගෙ දෙහෙ අබරන් අබේසිරිනාරායන, (3) ලෝකුරුගෙ තෙපානිස් අබේසිරිනාරායන, (4) ගින්නෙලිය ගමගෙ කරෝලිස්හාමි, (5) කෝන්ගලගෙ දිනෙස්හාමි, (6) හාරයනගෙ අඝිරිස්හාමි, (7) උබේසිරිනාරායනබඩල්ගේ සුවනිරිස්හාමි සහ (8) වත්තගෙ විපුලසේන, සියල්ලෝම පහල බෙලිගල්ලේය | 0 0 33·4 |
| 124 | වැබොබකුඹුර .. | කුඹුර .. | (1) වත්තගෙ විපුලසේන, පහල බෙලිගල්ල .. .. | 0 0 0·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1946ක්වූ ජූලි මස 4වෙනි දින පූ. භා. 9.30යේ කාලයට කහවත්ත ගම්සභා කාර්යාලයේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1946ක්වූ මැයි මස 21 වැනි දින
හම්බන්තොට කච්චේරියේදීය.

සී. ජේ. ඕර්ලොෆ්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ,

---

ආණ්ඩුවේ කවශ්‍යත්තයට, එනම්:—පුල්මෝඩ්ඩවෙයි ගම්සභා කොට්ඨාසයේ තෙන්නමරවඩි හැගෙණහිර ප්‍රසිබ ලිඳක් තැනීම සඳහා මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම් ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ සරහිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් පාලක කාරක සභාවේ නියෝගය පරිදි උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. ඒ 791. ගම—තෙන්නමරවඩි.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වෙදවිඩිනිකාඩු .. | ඉඩුම්ම .. | තෙන්නමරවඩියේ පදිංචි වේලුපිල්ලෙ කනගසබෙයි .. | 0 0 4 |
| 2 | එම .. | එම .. | එම මිගෙසිකිනාර්, එම හල්ලලිංගම් .. .. | 0 0 4·6 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1946ක්වූ ජූලි මස 11වෙනි දින දවල් 12යේ කාලයට පුල්මෝඩ්ඩවේ ගම්සභා උසාවියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1946ක්වූ මැයි මස 21වෙනි දින
ත්‍රිකුණාමලේ කච්චේරියේදීය.

ඇස්. ඇම්. ඩෆ්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

## දැන්වීම.

ලංකා (රාජ්‍යසභා තේරීම් පිළිබඳ) රාජසභා නියෝගය.

ජන්දදායක නාමලේඛන සංශෝධනය.

උතුරු කොළඹ, මැද කොළඹ, දකුණු කොළඹ යන ජන්දදායක කොට්ඨාස සම්බන්ධමයි.

උතුරු කොළඹ, මැද කොළඹ, දකුණු කොළඹ යන ජන්දදායක කොට්ඨාසවල ජන්දදායක නාමලේඛන 1946යේ වම්යටසංශෝධනය කරගෙන යන බැවින් 1946යේ ලංකා (ජන්දදායක නාමලේඛන) (විශෙෂ සැපයීම්) රාජසභා නියෝගයෙන් වෙනස්කරනලද 1931යේ ලංකා (රාජ්‍යසභා තේරීම් පිළිබඳ) රාජ්‍යසභා නියෝගයේ මීට අදාල විධිවිධාන සහ විශෙෂ වශයෙන් ජන්දදායකයන්ගේ සුදුසුකම් සම්බන්ධ විධිවිධාන සලකාබලන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. 6වෙනි වගන්තියේ ප්‍රකාරයට පහත සඳහන්වන සියළුම නියමයන් නොපිළිපදින කිසිම් අයෙක් කිසිම් ජන්දදායක නාම ලේඛනයක සවකීය නාමය ඇතුළත්කරවා ගැනීමට සුදුස්සෙක් නොවේ, එනම්:—

(ඒ) බ්‍රිතාන්‍ය යටත් වැසියෙකු බව;
(බී) වම් 1946යේ මැයි මස 22වෙනි දිනට වයස 21ට අඩු නැති බව;
(සී) වම් 1944ටේ නොවැම්බර් මස 22වෙනි දිනත් වම් 1946යේ මැයි මස 22වෙනි දිනත් අතරතුර නොකඩව හමාසයක කාලයක් ජන්දදායක නාමලේඛනය සම්බන්ධ තේරීම් පලාතේ පදිංචිව සිටි බව;
(ඩී) තමා හොඳ සිහියෙන් යුක්තනොවූවෙකු බවට එබඳු විනිශ්චයක්කිරීමට යොග්‍යවූ උසාවියක් විසින් විනිශ්චයක් කරනැති බව හා;
(ඊ) රාජ්‍යසභාවේ මන්ත්‍රීවරයෙකුගේ තේරීමක් සම්බන්ධයෙන් තමා දූෂ්‍ය හෝ නීත්‍යානුකූල නොවූ ක්‍රියාවක්කිරීම ගැන වරදකාරයෙකුව් නැති බවත්ය.

3. 6වෙනි වගන්තියේ ප්‍රකාර නුසුදුස්සකු නොවූ යම්කෙනෙකුට පහතින් කියවෙන සුදුසුකම් ඇත්නම් ජන්දදායක නාමලේඛනයෙහි තම නම ඇතුළත්කරවාගැනීමට තෙතෙම සුදුස්සෙක්වේ, එනම්:—

(ඒ) උප්පත්තියෙන් ලංකාව නිත්‍යවාසභූමියකොට ඇත් තෙකුවීම (7වෙනි වගන්තිය); හෝ
(බී) තෝරාගැනීමෙන් ලංකාව නිත්‍යවාසභූමිය කරගෙන සිටින්නෙකුවීම (7වෙනි වගන්තිය); හෝ
(සී) උගත්කම හා දේපළ පිළිබඳ විශෙෂ සුදුසුකම් ඇතිවීම; (8වෙනි වගන්තිය); හෝ
(ඩී) ස්ථිර වාසය සම්බන්ධව සහතිකපත්‍රයක් ලබාසිටීම (9වෙනි වගන්තිය).

4. ඉහල ඡේදයේ සඳහන් පංක්තිවලට අයත්වූද 1945 ජන්දදායක නාමලේඛනවල තම නම් අඩංගුනොවූද අය ලියාපදිංචි කිරීම පිණිස අනුගමනය කරන්නාවූ ක්‍රියා මාර්ගය මෙහි පහත සඳහන්වේ, එනම්:—

(ඒ) උප්පත්තියෙන් ලංකාව නිත්‍යවාසභූමියකොට ඇත්තාවූන් විසින් වම් 1946යේ ජූනි මස 3වෙනි දිනටත් ජූනි මස 30වෙනි දිනටත් අතර තම නිවෙස් කරා පැමිණෙන්නාවූ ගණන්ගැනීමේ මුලාදැනීන්ට (Enumerators) තමන්ගේ නම දිය යුතුයි.

(බී) තෝරාගැනීමෙන් ලංකාව නිත්‍යවාසභූමියකරගැනීමේ අභිනිවාසිකම කියන්නවුන් විසින් එලෙසම වූ 1946යේ ජූනි මස 3වෙනි දිනටත් ජූනි මස 30වෙනි දිනටත් අතර තම නිවෙස්කරා පැමිණෙන්නාවූ ගණන් ගැනීමේ මූලාදූනින්ට (Enumerators) තමන්ගේ නම් දියයුතුයි. ඒ හැර මොවුන් විසින් ගණන්ගැනීමේ මූලාදූනින්ට තමන්—

(i) අවුරුදු 5ක හෝ 5කට වැඩි ප්‍රමාණයක මුලු කාලයක්තුළ ලංකාවේ පදිංචිව සිටි බවද;

(ii) ලංකාව තමන්ගේ එකම්වූද නිත්‍යවූද වාසභූමිය කරගැනීමට අධිෂ්ඨානකරගෙන සිටින බවද ඔප්පුකර සිටිය යුතුයි.

ඡන්දදායකයන් ලියාපදිංචිකිරීමේ නිලධාරීතුමා ඔවුන් සුදුස්සන් බව ඒත්තුගත්තොත් පමණක් ඔවුන්ගේ නම් ඡන්දදායක නාමලේඛනවල ඇතුළත්කරනවා ඇත. ගණන්ගැනීමේ මූලාදූනින් වෙත උවමනාකරන සාක්ෂි ඔවුන් විසින් ඉදිරිපත්කරන්නේනම් එය පහසුවට කාරනයකි. තමුන් මෙහෙකරන ස්වාමින්ගෙන් ලබන ලිපුම් වැනි ලියවිලිවලින් දෙන සාක්ෂි ගණන්ගැනීමේ මූලාදූනින් විසින් පරීක්ෂාකර බලා ඔවුන්ට ආපසු දෙනවා ඇත.

සැලකියයුත්තක්.—උපතනිසාගෙන් ලැබූ නිත්‍යවාසය නිසා හෝ තම තීනාපයෙන් කරගත් නිත්‍යවාසය නිසා ලැබෙන සුදුසුකම් ඇති යමෙකුට ගණන්ගැනීමේ මූලාදූනියෙකු හමුවීමට නොහැකිනම් 1946යේ ජූනි 30වෙනි දින් පසුවුණු වහාම ඒ බව මේ කන්තෝරුවට දන්වා සිටිය යුතුයි.

(සී) හා (ඩී) උසස්කමේ හා දේපළවල විශේෂ සුදුසුකම් (8වෙනි වගන්තිය) හෝ ස්ථිර වාසයේ සහතිකපත්‍රයක විශේෂ සුදුසුකම් (9වෙනි වගන්තිය) පිට ඡන්දදායක නාම ලේඛනවල තමන්ගේ නම් ඇතුළත්කරවාගැනීමට සුදුසුකම් ඇති අය ඔවුන්ගේ නම් ඡන්දදායක නාම ලේඛනයෙහි ඇතුළත්කරවාගැනීමට කැමතිනම් අංක 9,558 සහ 1946 මැයි මස 21වෙනි දින දරන ලංකාණ්ඩුවේ විශේෂ ගැසට් පත්‍රයේ හා වූ 1946යේ මැයි මස 22වෙනි දින දරන ටයිම්ස් ඔෆ් සිලෝන්, වීරකේසරී සහ දිනමිණ යන ප්‍රවෘත්තිපත්‍රවලත් පළවූ දැන්වීමෙහි අඩංගු ගුරුහරුකම්වලට අනුව ලියවිල්ලකින් ඉල්ලුම්කළ යුතුයි. මීට උවමනා ආකෘති පත්‍ර (පෝරම) මේම කන්තෝරුවෙන් ලබාගත හැකිය.

5. ඡන්දදායක නාමලේඛන හැකිතාක් සම්පූර්ණවද නිවැරදිවද සෑදීම අභිප්‍රායව තිබෙන බැවින් ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමේ නිලධාරීතුමා සියලුම අයගේ සහයෝගිතාව මේ සම්බන්ධයෙන් ඉල්ලාසිටියි. උවමනා තොරතුරු ගණන්ගැනීමේ මූලාදූනින්ට අප්‍රමාදවද හරිහැටියටද සපයාදෙනවා ඇතැයි යන එතුමාගේ බලාපොරොත්තුවයි. තවද ලංකා (රාජ්‍යසභා තේරීම් පිළිබඳ) රාජ්‍යසභා නියෝගය යටතේ ලියාපදිංචිකිරීම ඡන්දය පාවිච්චිකිරීම උදෙසා පමණක් වුවත්, වෙනයම් කාරණයකට කිසිම සම්බන්ධයක් ඇතිනොවන බවත් සැලකිය යුතුයි.

ආර්. බී. නෑෂ්,
උතුරු කොළඹ, මැද කොළඹ, දකුණු කොළඹ
යන ඡන්දදායක කොට්ඨාශයන්හි ලියාපදිංචි
කිරීමේ නිලධාරීතැන.

වූ 1946ක්වූ මැයි මස 28වෙනි දින කොළඹ
රෙජිස්ට්‍රාර් ජනරාල් කන්තෝරුවේදීය.

---

නොම්මර 37 දරණ ලංකාරක්ෂක (මිශ්‍ර) නියෝගය යටතේ ආහාර ද්‍රව්‍ය ගෙනයෑමේ ආඥාව.

නොම්මර 9,523 සහ වූ 1946ක්වූ පෙබරවාරි මස 22 වෙනි දින දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකරනලද වූ 1946 පෙබරවාරි මස 4වෙනි දින දරණ දැන්වීම සම්බන්ධවයි.

ඉරිඟු, කුරක්කන්, මුංඇට, කොල්ලු, ලීමඇට හෝ වෙනත් ධාන්‍ය හෝ මූ. වගී, යටිකිද, වියළුව, වෙල්ලස්ස සහ බින්තැන්න යන කොට්ඨාසවල කිසියම් ස්ථානයක සිට, ඌව පළාතෙන් පිට ගෙනයෑම සඳහා අවසරපත්‍ර නිකුත්නොකරන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

ඇන්. මාණික්ක ඉඩයක්කාඩාර්,
උප ඒජන්තතුමා.
ඌවේ මහ ඒජන්තතුමා වෙනුවට.

වූ 1946ක්වූ මැයි මස 24වෙනි දින
බදුල්ල කච්චේරියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.